# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුර
## மாவட்ட செயலகம் - அநுராதபுரம
## District Secretariat - Anuradhapura

Fax : 025 - 2222235 E-mail :- dissecanu@sltnet.lk

| | දිස්ත්‍රික් ලේකම් மாவட்ட செயலகர் District Secretary | අතිරේක දිස්ත්‍රික් ලේකම් மேலதிக மாவட்டசெயலாளர் Addi.District Secretary | සහකාර දිස්ත්‍රික් ලේකම් உதவிமாவட்ட செயலாளர் Asst.District Secretary | ප්‍රධාන ගණකාධිකාරී பிரதம கணக்காளர் Chief Accountant | පරිපාලන නිලධාරී நிர்வாக உத்தியோகத்தர் Admin Officer |
|---|---|---|---|---|---|
| කාර්යාලය அலுவலகம் Office | 025 - 2235479<br>025 - 2222235 | 025 - 2235048 | 025 - 2222236 | 025 - 2222706 | 025 - 2222237 |
| නිවස/வதிவு/Res. | 025 - 2222205 | 025 - 2223833 | | 3299 | 025 - 2235537 |


මගේ අංකය எனது இல. My No: ANU/AGS/18/01/02/ නුවරවැව මගේ අංකය உமது இல. Your No: දිනය திகதி Date : 2020.06.10

අධ්‍යක්ෂ ( වාරි කළමණාකරණ )

වාරි කළමණාකරන අංශය,

තැ.පෙ.1702

වාරිමාර්ග දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල,

බෞද්ධාලෝක මාවත,

කොළඹ 07

**<u>මහ වාරිමාර්ග ව්‍යාපාර කන්න රැස්වීම් තීරණ ගැසට් පත්‍රයේ පල කිරීම</u>**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පහත සදහන් මහා වාරි ව්‍යාපාරයේ 2020 යල කන්නය සඳහා පැවැත්වූ වගා කන්න රැස්වීම් තීරණ ඔබ වෙත යොමු කරමි.

02. මෙම තීරණ ගැසට් පත්‍රයේ පළ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

I. නුවර වැව මහා වාරිමාර්ග ව්‍යාපාරය

ආර්.එම්.වන්නිනායක,

දිසාපති/ දිස්ත්‍රික් ලේකම්

අනුරාධපුර

ආර්.එම්. වන්නිනායක
දිසාපති/දිස්ත්‍රික් ලේකම්
අනුරාධපුර.

පිටපත්

1. කළාප වාරිමාර්ග අධ්‍යක්ෂ , කළාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය, අනුරාධපුර- කා.දැ.පි / අ.ක.ස
2. ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මධ්‍යම නුවරගම් පළාත - කා.දැ.පි / අ.ක.ස
3. ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, නැගෙනහිර නුවරගම් පළාත - කා.දැ.පි / අ.ක.ස
4. ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු, අනුරාධපුර - කා.දැ.පි / අ.ක.ස
5. නේවාසික ව්‍යාපාර කළමණාකරු , නුවර වැව ව්‍යාපාරය - කා.දැ.පි / අ.ක.ස

# ආණ්ඩුවේ නිවේදන

## කන්න රැස්වීම් තීරණ ප්‍රකාශයට පත් කිරීම

නුවර වැව මහා වාරිමාර්ග ව්‍යාපාරය

1994 අංක 13 දරණ වාරිමාර්ග ( සංශෝධන ) පනත යටතේ පිහිටුවන ලද නුවර වැව මහා වාරිමාර්ග ව්‍යාපාරයේ 2020 යල කන්නය සඳහා **"වගා රැස්වීම"** 2020.03.17 දින නුවරවැව නේවාසික ව්‍යාපාර කළමණාකරණ කාර්යාලයහිදී පැවැත්වූ අතර එහිදී 2020 යල කන්නයේ වගා කටයුතු සඳහා පහත සඳහන් වගා කාලසටහන හා යෝජනා සම්මත කරන ලදී.

**2020 යල කන්නයේ වගා කාල සටහන**

| අනු අංකය | කාරණය | නුවර වැව | | අන්තර් වැව් පුලියන්කුලම/ කෝපාකුලම/පානියන් කඩවල |
|---|---|---|---|---|
| | | ඉහළ | පහළ ( 4 ඇලෙන් පහළ ) | |
| 01 | වගා කිරීමට යෝජිත බිම් ප්‍රමාණය ( අක්කර ) | 2600 | | |
| 02 | වගා කිරීමට අපේක්ෂිත බෝගයේ වයස් සීමාව | මාස 3,3 ½ | මාස 3,3 ½ | මාස 3,3 ½ |
| 03 | වගා කිරීමට යෝජිත බෝග වර්ග | වී | වී | වී |
| 04 | ඇළවේළි සුද්ද කිරීමේ අවසන් දිනය | 2020.03,27 | 2020.03.20 | 2020.03.20 |
| 05 | ගොවීන් විසින් නියමිත දිනට ශුද්ධ නොකරන ඇලවේළි ගොවි සංවිධාන විසින් ශුද්ධ කර අවසන් කළ යුතු දිනය | 2020.04.02 | 2020.03.25 | 2020.03.25 |
| 06 | බිම් සකස් කිරීම සඳහා ජලය නිකුත් කිරීම ආරම්භ කරන දිනය | 2020.04.02 | 2020.03.25 | 2020.03.25 |
| 07 | යායට යන්ත්‍රෝපකරණ ඇතුළත් කළ යුතු දිනය | 2020.04.02 | 2020.03.25 | 2020.03.25 |
| 08 | යායෙන් යන්ත්‍රෝපකරණ ඉවත් කළ යුතු දිනය | 2020.04.26 | 2020.04.18 | 2020.04.18 |
| 09 | වපුරා හෝ පැල සිටුවා අවසන් කළ යුතු දිනය | 2020.04.26 | 2020.04.18 | 2020.04.18 |
| 10 | මුර ජලය ආරම්භ වන දිනය | 2020.04.29 | 2020.04.21 | 2020.04.21 |
| 11 | ජලය නිකුත් කිරීම අවසන් වන දිනය | 2020.07.25 | 2020.07.17 | 2020.07.17 |
| 12 | වගාව රක්ෂණය කර අවසන් කළ යුතු දිනය | 2020.04.26 | 2020.04.18 | 2020.04.18 |
| 13 | වගා හානි දැනුම් දිය යුතු අවසන් දිනය | 2020.08.08 | 2020.07.31 | 2020.07.31 |
| 14 | අස්වනු නෙලා අවසන් කිරීමට යෝජිත දිනය | 2020.08.25 | 2020.08.17 | 2020.08.17 |
| 15 | නඩත්තු මුදල අක්කරයකට | රු.800.00 | | |
| 16 | වාරි පද්ධතියට හානි කිරීමේ දඩය | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හානි තක්සේරුවට අනුව ගොවි සංවිධානය විසින් අය කිරීම | | |
| 17 | පිදුරු ගිනි තැබීමේ දඩය අක්කරයකට | වාරිමාර්ග තක්සේරුව අනුව අක්කරයක තුනී කර ඇති විට රු.5000.00 ගොඩ ගසා ඇති විට රු.3000.00 | | |

**සම්මත වූ අනෙකුත් නීති හා රෙගුලාසි**

1. ඇලවේළි / නිර්මිත හෝ වාරි පද්ධතියේ උපාංගවලට හානි කරන පුද්ගලයන් නීතිය හමුවට පැමිණවීම වාරිමාර්ග ආඥා පනතේ 23 වෙනි වගන්තිය ප්‍රකාරව ගොවි සංවිධාන වෙත බලය පවරා ඇති අතර එකී පනතේ viii කොටසේ 93 වෙනි වගන්තිය අනුව වැරදිකරුවන් දඩුවමට ලක්වනු ඇත.
2. වාරි ජලයට අපද්‍රව්‍ය / විෂ ද්‍රව්‍ය එක් කරන තැනැත්තන් සම්බන්ධයෙන් 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 84 ( 1 ) වගන්තිය ප්‍රකාරව වරදකරුවන් නීතිය හමුවට පැමිණවීමට ගොවි සංවිධානයේ නියෝජිතයින් හට බලය පවරා ඇත.
3. මෙම කන්න රැස්වීම් තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම ගොවි සංවිධානය වෙත පවරා ඇති අතර ගොවි සංවිධානය වෙනුවෙන් ක්‍රියා කරන ගොවි නියෝජිතයින් හෝ ජල පාලකවරුන් රාජකාරියෙහි නියැලෙන විට බාධා කිරීමක් , ඉඩ නොදීමක් , පරිභව කිරීමක් හෝ හිංසා කිරීමක් සිදු කිරීම , රාජකාරියට බාධා කිරීමේ වරදට වරදකරුවේ. ( ඒ සඳහා වාරිමාර්ග ආඥා පනතේ 95 වැනි වගන්තිය හා 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 72 වගන්තිය ප්‍රකාරව නීතිමය රැකවරණ සළසා ඇත.
4. අනපේක්ෂිත ලෙස අයහපත් කාළගුණික තත්වය හෝ කිසියම් පාලනය කරලත නොහැකි බාහිර උපද්‍රවයක් ඇති වූ විට මෙම තීන්දු තීරණ සංශෝධනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම ව්‍යාපෘති කළමණාකරන කමිටුව සතුය.
5. මෙම නිවේදනයේ යම් සඳහනක් පිළිබඳව අර්ථ නිරූපන බලය අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් සතුය.

ආර්.එම්.වන්නිනායක,

දිසාපති/ දිස්ත්‍රික් ලේකම්

අනුරාධපුර දිස්ත්‍රික්කය

ආර්.එම්. වන්නිනායක
දිසාපති/දිස්ත්‍රික් ලේකම්
අනුරාධපුර.